# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - ජූලි 2024

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

## A - කොටස

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න

**ප්‍රශ්න අංක 01** - ලකුණු 40
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා වූ ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා ගැනීමට අවශ්‍ය විය. ප්‍රශ්න අංක **1.11** සිට **1.15** දක්වා ලබා දී ඇති ප්‍රකාශනයන් සඳහා **'සත්‍ය'** හෝ **'අසත්‍ය'** සහ ප්‍රශ්න අංක **1.16** සිට **1.20** දක්වා ප්‍රශ්න අංකය සමග පිළිතුර උත්තර පොතේ සඳහන් කිරීම අවශ්‍ය විය.

අයදුම්කරුවන් එක් එක් අනු කොටස් සඳහා ලබා දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුණු වැරදි / දුර්වලතා කිහිපයක් පහත පරිදි වේ:

**ප්‍රශ්න අංක 1.1**

අස්තිත්වයක සියලු වගකීම් අඩුකිරීමෙන් පසු වත්කම්වල ඉතිරි වන හිමිකම වන්නේ කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර ලෙස "ස්කන්ධය" සඳහන් කර තිබුණ නමුත් ඇතැම් අයදුම්කරුවන් "ආදායම්" හෝ "වියදම" ලෙස වැරදි උත්තර ලබා දී තිබුණි.

**ප්‍රශ්න අංක 1.2**

මෙම ප්‍රශ්නය මඟින් දී ඇති ප්‍රකාශය සම්බන්ධයෙන් නියෝජනය වන පාරිසරික සාධකය කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර ලෙස නෛතික පරිසරය ලබා දී තිබුණත් ඇතැම් අයදුම්කරුවන් විසින් තාක්ෂණික පරිසරය ලෙස වැරදි පිළිතුරු ලබා දී තිබුණි.

**ප්‍රශ්න අංක 1.3**

''භාණ්ඩ ලැබෙන අවස්ථාවේදී භාණ්ඩය ලැබුණු බව තහවුරු කරමින් ගබඩා භාරකරු විසින් නිකුත් කරනු ලබන නිවැරදි මූලාශ්‍ර ලියවිල්ල තෝරන්න'' යනුවෙන් අයදුම්කරුවන් වෙතින් විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර භාණ්ඩ ලැබීමේ පත්‍රය යනුවෙන් සඳහන් කර තිබුණි. නමුත් සමහර අයදුම්කරුවන් විසින් ගැණුම් ඇණවුම ලෙස වැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.4**

ඉදිරිපත් කර ඇති තොරතුරු මත පදනම්ව 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ සඳහා ලාභය විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි ලාභය ලෙස රු. 1,650,000/= ඉදිරිපත් කර තිබුණද සමහර අයදුම්කරුවන් විසින් රු. 2,450,000/= ක් ලෙස වැරදි පිළිතුරු ද ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.5**

ආපසු එවන ලද, ණයට විකුණන ලද භාණ්ඩ වාර්තා කිරීම සඳහා විකුණුම්කරු විසින් භාවිත කරනු ලබන මූලික සටහන් පොත වන්නේ කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර වන දෛනික ආපසු එවුම් පොත ලෙස ඉදිරිපත් කර තිබුණද ඇතැම් අයදුම්කරුවන් විසින් දෛනික ගැනුම් පොත හා දෛනික විකුණුම් පොත ලෙස වැරදි උත්තරද ලබා දී තිබුණි.

**ප්‍රශ්න අංක 1.6**

ඉදිරිපත් කර ඇති තොරතුරු මත පදනම්ව 2024 මාර්තු 31 දින මෝටර් රථයේ ධාරණ අගය (ශුද්ධ පොත් අගය) ගණනය කර ඉදිරිපත් කිරීමට උපදෙස් දී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් එය නිවැරදිව ගණනය කර රු. 2,560,000/= ක් ලෙස නිවැරදි පිළිතුර ලබාදී තිබුණි. සමහර අයදුම්කරුවන් විසින් වැරදි ගණනය කිරීම් මත රු. 2,400,000/= ක් හා රු. 3,200,000/= ක් ලෙස වැරදි උත්තර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.7**

ඉදිරිපත් කර ඇති ගනුදෙනුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑමට අදාළව නිවැරදි පිළිතුර තේරීමට උපදෙස් ලබා දී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර ලෙස අංක 01 ඉදිරිපත් කර තිබුණි. සමහර අයදුම්කරුවන් වැරදි පිළිතුර වන අංක 04 ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.8**

ණය ගැතියන්ගෙන් අඩමාන ණය සඳහා ප්‍රතිපාදනයකට අදාළ ගිණුම්කරණ සංකල්පය වන්නේ කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර ලෙස ආරක්ෂණ සංකල්පය ඉදිරිපත් කර තිබුණි. නමුත්, සමහර අයදුම්කරුවන් විසින් ප්‍රමාණාත්මක බවේ සංකල්පය හා සංගතතා සංකල්පය යන වැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.9**

පොදු ජර්නලයේ වාර්තා **නොකරන** ගනුදෙනුව කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් අංක 01 නිවැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුන නමුත් සමහර අයදුම්කරුවන් විසින් අංක 02 හා 04 යන වැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.10**

ඉදිරිපත් කරන ලද තොරතුරු හා සම්බන්ධව අදාළ වන ගිණුම්කරණ සංකල්පය වන්නේ කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි උත්තරය ලෙස උපචිත සංකල්පය ඉදිරිපත් කර තිබුණි. සමහර අයදුම්කරුවන් විසින් අඛණ්ඩ පැවැත්ම සංකල්පය හා ගැලපුම් සංකල්පය ඉදිරිපත් කර තිබුණි.

ප්‍රශ්න අංක 1.11 සිට 1.15 දක්වා අයදුම්කරුවන් වෙත ලබා දී ඇති එක් එක් ප්‍රකාශය "සත්‍ය"හෝ "අසත්‍ය" ලෙස උත්තර පත්‍රයේ සඳහන් කළ යුතුය.

බොහොමයක් අයදුම්කරුවන් විසින් ප්‍රශ්න අංක 1.11, 1.12, 1.13 හා 1.15 සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රකාශයන් නිවැරදිව අවබෝධ කරගෙන නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.14**

බොහොමයක් අයදුම්කරුවන් විසින් දී ඇති ප්‍රකාශය සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් නොතිබීම මත නිවැරදි පිළිතුර "අසත්‍ය" වෙනුවට "සත්‍ය" යනුවෙන් ඉදිරිපත් කර තිබුණි.

අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර ප්‍රශ්න අංක සමඟ උත්තර පත්‍රයේ සඳහන් කළ යුතුය.

**ප්‍රශ්න අංක 1.16**

මෙම ප්‍රශ්නය මගින් ගිණුම්කරණ දෝෂ (වැරදි) සඳහා හේතු දෙකක් ලැයිස්තුගත කිරීමට උපදෙස් ලබා දී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.17**

බොහොමයක් අයදුම්කරුවන් විසින් ''වගකීමක්'' යන්න නිවැරදිව නිර්වචනය කර තිබූ අතර, සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක් සම්පූර්ණ නිර්වචනය ඉදිරිපත් කර නොතිබිණි.

**ප්‍රශ්න අංක 1.18**

බොහොමයක් අයදුම්කරුවන් විසින් ''විශේෂිත ගිණුම්කරණ මෘදුකාංග'' නිවැරදි ව පැහැදිලි කිරීම කර තිබුණද, සමහර අයදුම්කරුවන් මේ සඳහා පොදු මෘදුකාංග පද්ධති නම් කර තිබුණි. උදා. ACC PAC, Quick Book, MYOB

**ප්‍රශ්න අංක 1.19**

බොහොමයක් අයදුම්කරුවන් විසින් බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීමට හේතු දෙකක් ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.20**

බොහොමයක් අයදුම්කරුවන් විසින් මූල්‍ය මිනුම් සංකල්පය නිවැරදිව හා පැහැදිලිව නිර්වචනය කර තිබුණි.

## B - කොටස

**ප්‍රශ්න අංක 02 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ලෙජර් ගිණුම් පිළියෙල කිරීමෙන් පසු ශේෂ පිරික්සුම පිළියෙළ කිරීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබුණි. පොදුවේ පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(1) ශේෂ පිරික්සුම සකස් කිරීම වෙනුවට සමහර අයදුම්කරුවන් ලෙජර් ගිණුම පමණක් පිළියෙල කර තිබුණි.

(2) ශේෂ පිරික්සුමේ හර විය යුතු සංඛ්‍යා බැරට ද, බැර විය යුතු සංඛ්‍යා හරටද සටහන් කර තිබුණි.

(3) ණයට විකුණුම් හා ණයට ගැනුම්, ණයගැති හා ණයහිමි පාලන ගිණුම තුළින් නිවැරදිව ගණනය කර නොතිබුණි.

(4) අත්පිට විකුණුම්, ණයට විකුණුම් හා අත්පිට ගැනුම්, ණයට ගැනුම් ශේෂ පිරික්සුමේ වෙන වෙනම අයිතමයන් ලෙස සටහන් කිරීම.

(5) 2024 ජනවාරි 01 දින මිලදී ගන්නා ලද යන්ත්‍රය සඳහා මාස 06 ක ක්ෂය වීම නිවැරදිව ගණනය කර නොතිබුණි.

(6) සුළු මුදල්වලින් වියදම් දැරීම හා සුළු මුදල් ශේෂය නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.

(7) ඉදිරියට ගෙවන ලද කාර්යාල කුලී අත්තිකාරම් මුදල හා කාර්යාලීය කුලිය නිවැරදිව ගණනය කර නොතිබුණි.

## ප්‍රශ්න අංක 03 - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම් පිළියෙළ කිරීම සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නය මගින් සිදුකර තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් සතුටුදායක මට්ටමෙන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු ඉදිරිපත් කර තිබුණු අතර පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(1) නිවැරදි ආකෘතියට ඉදිරිපත් කර නොතිබුණි.

(2) නොනිමි වැඩ ප්‍රාථමික පිරිවැයට ගැලපීම් නොකර නිෂ්පාදන පිරිවැයට ගැලපීම් කර තිබුණි.

(3) නිශ්පාදන සේවකයන්ට සෘජු වේතන, සෘජු වියදම් යටතේ ගැලපීම් කළ යුතු වුවද, සමහර අයදුම්කරුවන් පොදු කාර්ය වියදම් ලෙස සටහන් කර තිබුණි.

(4) අමුද්‍රව්‍ය මුල තොගය හා අමුද්‍රව්‍ය අවසාන තොගය මාරු කර ගණනය කිරීම් සිදු කර තිබුණි.

(5) නිෂ්පාදන පිරිවැය මත 15% ක ලාභ අතිරික්තය ගණනය කර නොතිබුණි.

(6) පාරිභෝජනය කළ අමුද්‍රව්‍ය, ප්‍රාථමික පිරිවැය හා මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන ලද අගයන් සඳහා ලියා නොතිබුණි.

(7) විදුලිය, ආරක්ෂක ගාස්තු හා කුලිය කර්මාන්තශාලාව හා කාර්යාලය අතර දී ඇති ප්‍රතිශතය අනුව නිවැරදිව ගණනය කර නොතිබූ අතර සම්පූර්ණ ප්‍රමාණයම පොදුකාර්ය වියදම් යටතේ පෙන්වා තිබුණි.

## ප්‍රශ්න අංක 04 - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය (a) හා (b) ලෙස කොටස් දෙකකින් සමන්විතය.

**(a) කොටසින්** වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් පිළියෙල කිරීමටත් **(b) කොටසින්** අවිනිශ්චිත ගිණුම පිළියෙළ කිරීමටත් උපදෙස් ලබා දී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් සතුටුදායක මට්ටමක පිළිතුරු ඉදිරිපත් කර තිබූ අතර, පහත සඳහන් දුර්වලතා හා වැරැදි පොදුවේ දක්නට ලැබුණිඃ

**(a)**

(1) ජර්නල් සටහන් වෙනුවට ලෙජර් ගිණුම් පිළියෙල කර තිබීම.

(2) ජර්නල් සටහනට අදාල හර හා බැර අගයන් ජර්නල් සටහන් ලිවීමේදී මාරුකර ඉදිරිපත් කර තිබුණි.

(3) ජර්නල් සටහන් පිළියෙල කිරීමේදී ජර්නලයේ ගනුදෙනුව ඉදිරියෙන් හර හා බැර යනුවෙන් සටහන් කර නොතිබුණි.

(4) අවිනිශ්චිත ගිණුම මගින් නිවැරදි කළ යුතු වැරදි සටහන් හඳුනාගෙන නොතිබීම.

(5) බැංකු ණය පොලීය වැරදි ලෙස පොලී ආදායම් ගිණුමට බැරවීම සම්බන්ධයෙන් නිවැරදි කරන ජර්නල් සටහන නිවැරදිව සඳහන් කිරීමට කටයුතු කර නොතිබුණි.

(6) මිලදී ගන්නා ලද මුද්‍රණ යන්ත්‍රයේ වටිනාකම පරිගණක අලුත්වැඩියා ගිණුමට හර කිරීම අයදුම්කරුවන් විසින් නිවැරදිව හඳුනාගෙන නිවැරදි කර තිබුණද ඊට අදාළ රු.4,000/- ක ක්ෂය වීම සඳහා ජර්නල් සටහන ඉදිරිපත් කර නොතිබුණි.

(7) ණයගැතියන්ට දුන් රු.12,500/- ක වට්ටමක් ලද වට්ටම් ගිණුමට බැර කිරීම නිවැරදිව හඳුනාගෙන ජර්නල් සටහන ඉදිරිපත් කර නොතිබුණි.

(8) 2024 ජනවාරි මාසය සඳහා ගෙවන ලද රු.24,000/- ක කුලී වියදම රු.42,000/- ක් ලෙස සටහන් කිරීම නිවැරදි කිරීමේ කිරීමේ දී වෙනස ගැලපීම වෙනුවට සම්පූර්ණ මුදල සඳහාම ජර්නල් සටහන ඉදිරිපත් කර තිබුණි.

**(b)** අවිනිශ්චිත ගිණුම පිළියෙළ කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය:

(1) අවිනිශ්චිත ගිණුමේ ආරම්භක හර ශේෂය ගිණුමේ බැර ලෙස සටහන් කර තිබුණි.

(2) අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂය අවිනිශ්චිත ගිණුමේ හර පැත්තේ සටහන් කර නොතිබුණි.

(3) අවිනිශ්චිත ගිණුමට අදාළ හර සටහන් එම ගිණුමේ බැර පැත්තේ ද, බැර සටහන් එම ගිණුමේ හර පැත්තේ ද වශයෙන් පැති මාරු කර ගිණුමේ සටහන් කර තිබුණි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය **(A)** හා **(B)** වශයෙන් අනු කොටස් දෙකකින් සමන්විත වේ.

**(A) කොටස** මගින් දී ඇති එක් එක් ගනුදෙනුව තුළින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබුණි.

**(B) කොටසින්** ඉදිරිපත් කර ඇති තොරතුරු පදනම් කරගෙන,

**(a)** ගලපන ලද මුදල් පාලන ගිණුම පිළියෙළ කිරීමටත්,

**(b)** කොටසින් 2024 ජනවාරි 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමට උපදෙස් ලබා දී තිබුණි.

**(A)** ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම:

(1) ඉදිරිපත් කර ඇති එක් එක් ගනුදෙනු මගින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම පිළිබඳව එනම් වත්කම්, වගකීම්, ආදායම්, වියදම් හා හිමිකම් වැඩිවීම හෝ අඩුවීම පිළිබඳ ව සමහර අයදුම්කරුවන් තුළ නිවැරදි අවබෝධයක් නොමැතිව සමීකරණයේ ධන හා ඍණ අගයන් රහිතව සටහන් ඉදිරිපත් කර තිබුණි.

(2) සමහර අයදුම්කරුවන් අදාළ ගණුදෙනු මගින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වත්කම් පැත්තේ හෝ වගකීම් පැත්තේ පමණක් තනි සටහනක් ලෙස ඉදිරිපත් කර තිබුණි.

(3) ගිණුම්කරණ සමීකරණයේ දී ඇති ගණුදෙනුවල මූල්‍යමය අගයන් සටහන් කිරීම වෙනුවට 'වැඩිවීම' 'අඩුවීම' යනුවෙන් වචනයෙන් සඳහන් කර තිබුණි.

**(B)** **(a)** ගලපන ලද මුදල් පාලන ගිණුම පිළියෙළ කිරීම.

(1) මුදල් පාලන ගිණුමේ ආරම්භක හර ශේෂය වන රු. 25,000/= ක වටිනාකම මුදල් පාලන ගිණුමේ සටහන් කර නොතිබුණි.

(2) අංක 1 සිට 5 දක්වා ඉදිරිපත් කරන ලද වෙනසට හේතු වූ කරුණුවලින් මුදල් පාලන ගිණුමට බලපාන අංක 1, 2 හා 3 වෙනම හඳුනාගෙන මුදල් පාලන ගිණුමේ ගැලපීම් කිරීමට සමහර අයදුම්කරුවන් විසින් කටයුතු කර නොතිබුණි.

(3) තවත් සමහර අයදුම්කරුවන් ගලපන ලද මුදල් පාලන ගිණුමට හරවිය යුතු අගයන් බැරටත්, බැරවිය යුතු අගයන් හරටත් මුදල් පාලන ගිණුමේ සටහන් කර තිබුණි.

(4) මුදල් පොත නියමිත පරිදි තුලනය කර අවසාන ශේෂය ගණනය කර නොතිබුණි.

**(b)** 2024 ජනවාරි 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙළ කිරීම:

(1) බැංකු සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් කලයුතු "තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ තැන්පත්" හා "නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් පත්" පිළිබඳව පැහැදිලි අවබෝධයක් සමහර අයදුම්කරුවන් තුළ නොතිබීම හේතුවෙන් අංක 01 සිට 05 දක්වා වූ සියලුම කරුණු ඇතුළත්ව බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර තිබුණි.

(2) 2024 ජනවාරි 31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂයට එකතු කළ යුතු සංඛ්‍යා අඩුකිරීමටත් අඩු කළ යුතු සංඛ්‍යා එකතු කිරීමටත් කටයුතු කර තිබූ නිසා සංශෝධිත මුදල් පාලන ගිණුමේ ශේෂය වැරදි අගයක් ගෙන තිබුණි.

## C - කොටස

**ප්‍රශ්න අංක 06 - ලකුණු 20**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය **(a)** හා **(b)** වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. **(a) කොටසින්** විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළියෙළ කිරීම සහ **(b) කොටසින්** මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙළ කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබුණි. සමස්ත කාර්ය සාධනය හොඳ මට්ටම පැවතුණි.

පොදුවේ නිරීක්ෂණය වූ වැරදි හා අඩුපාඩු පහත පරිදි වේ:

**(a) විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළියෙළ කිරීම:**

(1) වර්ෂයට අදාළ නිවැරදි ක්ෂය ප්‍රමාණය සරල මාර්ග ක්‍රමය යටතේ ගණනය කර ආදායම් ප්‍රකාශනයට ගෙන නොතිබීම.

(2) විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කළ යුතු අයිතමයන් පිළිබඳව අවබෝධයක් නොමැති වීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු සමහර අයිතමයන් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කර තිබුණි.

(3) බොල් ණය වශයෙන් වර්ෂය තුළ ලියා හරින ලද රු. 50,000/= ක මුදල සටහන් කර නොතිබුණි.

(4) දළ ලාභය ගණනය කිරීම සඳහා සමහර අයදුම්කරුවන් විසින් වර්ෂයේ මුල් තොගය අඩුකර අවසාන තොග එකතු කර තිබුණි.

(5) ශේෂ පිරික්සුමේ අයිතමයන් දහස් ගණනින් හා ගැලපිළි වල අයිතමයන් සම්පූර්ණ අගයන් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශනය සඳහන් කර තිබුණි.

(6) 2024 මාර්තු මාසයට අදාළ වූ රු. 32,000/= ක විදුලි වියදම නියමිත පරිදි වර්ෂයේ වියදමට ගලපා නොතිබුණි.

(7) මාස 06 ක් සඳහා ගෙවන ලද කුලී අත්තිකාරම් මුදල නියමිත පරිදි කුලී වියදමින් අඩුකර ඉදිරිපත් කර නොතිබුණි.

(8) 2024 ජනවාරි 01 දින රු. 15,000/= ක මාසික පොලියට ලබා ගන්නා ලද බැංකු ණය සඳහා වූ මාස 03 අදාළ පොලිය සටහන් කර නොතිබුණි.

(9) අඩමාන ණය සඳහා වූ 5% වෙන් කිරීම ගැලපීම් කර නොතිබුණි.

**(b) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සකස් කිරීම:**

(1) වර්ෂය තුළ කපා හරින ලද බොල්ණය හා අඩමාන ණය සඳහා වූ ප්‍රතිපාදන වෙළඳ ලැබිය යුතු මුදලින් අඩු කර නොතිබුණි.

(2) 2023 අප්‍රේල් 01 දිනට වූ සමුච්චිත ක්ෂය වීම එකතු නොකර වර්ෂයේ ක්ෂයවීම පමණක් සමුච්චිත ක්ෂය ලෙස පෙන්වා තිබුණි.

(3) ගෙවිය යුතු විදුලි බිල් ගාස්තුව සටහන් කර නොතිබුණි.

(4) 2024 ජනවාරි 01 දින ලබා ගන්නා ලද බැංකු ණය වෙනුවෙන් අදාළ කාල සීමාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් උපචිත බැංකු ණය පොලී වැරදියට ගණනය කර තිබුණි.

(5) මාස 12 කාල සීමාවකට ලබා ගන්නා ලද බැංකු ණය ජංගම වගකීම් යටතේ ඉදිරිපත් කළ යුතු වුවද, සමහර අයදුම්කරුවන් විසින් දිගු කාලීන ණය යටතේ ඉදිරිපත් කර තිබුණි.

(6) මාස 06 ක් සඳහා ආපසු ගෙවන අත්තිකාරම් වශයෙන් ගෙවන ලද කුලී අත්තිකාරම් මුදල ජංගම වත්කම් යටතේ ඉදිරිපත් කර නොතිබුණි.

(7) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුළත් කළ යුතු අයිතමයන් පිළිබඳව මූලික අවබෝධයක් නොමැතිකම නිසා මිලදී ගැනුම්, විකුණුම් , ආරම්භක තොගය කුලී ආදායම සහ වෙනත් වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුළත් කර තිබුණි.

(8) සමහර අයදුම්කරුවන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අයිතමයන් වර්ගීකරණය සිදු නොකර සියලුම අයිතමයන් එකට සටහන් කිරීම. උදාහරණ: ජංගම නොවන වත්කම්, ජංගම වත්කම්, ස්කන්ධය හා වගකීම්, ජංගම වගකීම් යනුවෙන්.

(9) වෙළඳ ලැබිය යුතු මුදල් ජංගම බැරකම් යටතේ ද වෙළඳ ගෙවිය යුතු මුදල් ජංගම වත්කම් යටතේ ද සටහන් කර තිබුණි.

- - -

**අයදුම්කරුවන්ගේ තේරුම් ගැනීම දියුණු කිරීමේ සැළකිල්ලට ගත යුතු සාමාන්‍ය කරුණු:**

1. **විෂය නිර්දේශයේ සම්පූර්ණ කරුණු හොඳින් අධ්‍යයනය කිරීම සහ සෑම ඒකකයකින්ම හෝ අංශයකින්ම අපේක්ෂිත දැනුම් මට්ටම පිළිබඳ මනා අවබෝධයක් දියුණු කර ගැනීම.**
2. **අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය කිහිපවතාවක්ම හොඳින් කියවිය යුතු අතර, සියලුම ගණනය කිරීම්වලට අදාළ පෙර වැඩ පැහැදිලිව පෙන්වා දැක්විය යුතුය.**
3. **උත්තර සැපයීමේදී උපකල්පනයන් අදාළ වන්නේ නම්, එම උපකල්පනයන් පැහැදිලිව දැක්විය යුතුය.**
4. **අත් අකුරු පැහැදිලි විය යුතු අතර ප්‍රශ්න අංකයන් නිවැරදිව දැක්විය යුතුය. උත්තර පත්‍රය භාරදීමට පෙර ප්‍රශ්න අංක නැවත පරීක්ෂා කිරීම ආදී දේ අනිවාර්ය වේ.**
5. **ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව අනුගමනය කළ යුතුය.**
6. **අවබෝධය, කුසලතා සහ පළපුරුද්ද දියුණු කර ගැනීම සඳහා පසුගිය ප්‍රශ්න පත්‍ර සහ යෝජිත උත්තර උපකාරීවනු ඇත. සමාන රටාවන් සහ ව්‍යුහයන් නැවතත් ප්‍රශ්න පත්‍ර තුළ ඇතුළත් විය හැකි බැවින් එය සෑම විටම වාසිදායක වනු ඇත.**
7. **මෙම විෂයට අදාළව ස්ව-අධ්‍යන පොත සහ සඟරා මෙන්ම අදාළ විෂය කොටස් සඳහා අදාළවන අනෙකුත් කියවීම් පරිශීලනය කිරීම සිදු කරන්න.**
8. **කාල කළමනාකරණය විභාගයේදී ඉතා වැදගත් වේ. සෑම ප්‍රශ්නයකටම වෙන් කර ඇති ලකුණු දෙස බැලීමෙන්, උත්තර සැපයීමට වැය කළ යුතු කාලය පිළිබඳ ඇස්තමේන්තුවක් කළ හැකිය.**
9. **විභාගය සමත්වීමට තිර අදිටනින් යුතුව, මනා සූදානමකින් විභාගයට පෙනී සිටීම සිදු කරන්න.**

- * * * -